රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි: 01/2019

මගේ අංකය: EST-3/DICIP/06/0272
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

2019.03.19

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## අසාධු ලේඛනගත කරන ලද නිලධරයන් නැවත සේවයේ පිහිටුවීම

අසාධු ලේඛනගත කළ යුතු රජයේ නිලධරයන් සම්බන්ධ විධිවිධාන ඇතුළත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XIX පරිච්ඡේදය හා ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ V පරිච්ඡේදයේ 8 වගන්තිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. ඒ අනුව, අසාධු ලේඛනගත කරනු ලබන මධ්‍යම රජයේ නිලධරයන් සම්බන්ධ තොරතුරු රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ අදාළ පරිශිෂ්ට පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වේ. 2012.12.10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි 08/2012හි විධිවිධාන හා මගේ අංක EST-3/DICIP/06/0199 හා 2019.01.28 දිනැති ලිපියේ උපදෙස් පරිදි පළාත් ප්‍රධාන ලේකම් විසින් අසාධු ලේඛනගත කළ යුතු පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන් පිළිබඳ තොරතුරු තම පළාත් සභාවට අයත් ආයතන ප්‍රධානීන් වෙතින් ලබාගෙන ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු ය.

03. එසේම, නිලධරයකුගේ නම අසාධු ලේඛනගතව තිබීම ඔහු අවසන් වරට දැරූ තනතුරේ නැවත සේවයේ පිහිටුවීමට බාධාවක් නොවේ. දැනටමත් අසාධු ලේඛනගත වී ඇති නිලධරයකුගේ නම ඉන් ඉවත් කළ හැකිවන්නේ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරයේ හෝ වෙනත් අධිකරණයක නියෝගයක් මත හෝ පත් කිරීමේ බලධරයා/ විනය බලධරයාගේ නියෝගයක් මත පමණි. එසේ නැවත සේවයේ පිහිටුවීමෙන් පසු ඔහුගේ නම අසාධු ලේඛනයෙන් ඉවත් කිරීමට අදාළ බලධරයා විසින් ඉල්ලීමක් කළ යුතු ය.

04. අසාධු ලේඛනගතව සිටි නිලධරයෙකුට නැවත සේවයට පැමිණෙන ලෙසට නියෝගයක් ලද පසු එම නිලධරයාට සේවයට වාර්තා කරන ලෙස උපදෙස් ලබාදිය යුතු අතර, එලෙස සේවයට වාර්තා කළ පසු එම දිනය ද සඳහන් කරමින් පත් කිරීමේ බලධරයා/ විනය බලධරයා විසින් ඇමුණුම 01හි ඇතුළත් ආකෘතිය මා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉනික්බිතිව නිකුත් කරනු ලබන අසාධු ලේඛනයෙන් එම නිලධරයාගේ නම ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.

05. අසාධු ලේඛනගත කළ මධ්‍යම රජයේ හා පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන්ගේ නම් ඇතුළත් අසාධු ලේඛනය www.pubad.gov.lk වෙබ් අඩවියෙහි "විශේෂ නිවේදන" යටතෙහි ඇතුළත් කර ඇත.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

ඇමුණුම 01

**<u>අසාධු ලේඛනගත වී ඇති නිලධරයකුගේ නම ඉන් ඉවත් කිරීම</u>**

1. නිලධරයාගේ සම්පූර්ණ නම :- ..........................................................................................
.............................................................................................................................................
2. ජාතික හැඳුනුම්පත් අංකය:-..............................................................................................
3. අසාධු ලේඛනගත වන අවස්ථාවේ දී සේවය කළ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/රාජකාරී ස්ථානය :-.................................................................................................................
4. අසාධු ලේඛනගත වන අවස්ථාවේ දී දරමින් සිටි තනතුර හා ශ්‍රේණිය:-.......................................
.............................................................................................................................................
5. නිලධරයාගේ නම ඇතුළත් අසාධු ලේඛනයේ යොමු අංකය දිනය හා නමට අදාළ අනු අංකය:-
.............................................................................................................................................
6. පළාත් රාජ්‍ය සේවයේ/ මධ්‍යම රජයේ නිලධරයෙක් ද යන වග:- ...............................................
7. නැවත සේවයේ පිහිටුවීමට බලය දුන් ලිපියේ යොමුව :-............................................................
(බලධරයා ද සඳහන් කළ යුතු ය)
8. සේවයට වාර්තා කළ දිනය :- ..........................................................................................

ඉහත තොරතුරු අනුව .................................................................................මයා/මිය/මෙනවිය ගේ නම අසාධු ලේඛනයෙන් ඉවත් කරන ලෙස දන්වා සිටිමි.

දිනය :-..............................

.......................................................
විනය බලධරයාගේ අත්සන හා
නිල මුද්‍රාව